සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

චිත්‍ර කලාව I
சித்திரக்கலை I
Art I

51 S I

## II කොටස

- මෙම කොටස අනුකොටස් **තුනකින්** සමන්විත ය.
- 'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඉ' යන කොටස් දෙකෙන් **එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
  (අවශ්‍ය තැන්හි පිළිතුරු සවිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ.)

## 'අ' කොටස

### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

1. අනුරාධපුර යුගයේ පැවති බිතු සිතුවම් සම්ප්‍රදාය පොළොන්නරු යුගය අවසානය දක්වාම ක්‍රමිකව විකාශනය වෙමින් පැවත ආ බවට සාක්ෂි තිබේ.

   (i) හිඳගල ලෙන් විහාරයේ පැරණි බිතු සිතුවම් අතරින් ශේෂ වී තිබූ බිතු සිතුවම් කොටස සඳහා යොදාගෙන ඇති තේමා **දෙක** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) සීගිරි බිතු සිතුවම් අතර කාන්තා රූපය විවිධත්වයෙන් යුතුව චිත්‍රණය කර ඇති ආකාරය පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

   (iii) පොළොන්නරුව තිවංක පිළිමගෙයි පැරණි චිත්‍ර හා මහියංගන ධාතු ගර්භයේ සිතුවම් පිළිබඳව සංසන්දනාත්මක ඇගයීමක් කරන්න. (ලකුණු 8 යි.)

2. පොළොන්නරු යුගයේ බෞද්ධාගමික ගොඩනැගිලි ඉදිකිරීමේ දී එක්වූ හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ ගම්පොළ සහ මහනුවර යුගවලදී ද එලෙසින්ම දක්නට ලැබිණ.

   (i) පොළොන්නරු යුගයේ දී ගෙඩිගේ සම්ප්‍රදායට අනුව ගඩොලින් ඉදිවූ බෞද්ධාගමික වාස්තු විද්‍යා නිර්මාණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) අංක 2 ශිව දේවාලයේ දක්නට ලැබෙන හින්දු ආගමික වාස්තු විද්‍යා ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5 යි.)

   (iii) ගම්පොළ යුගයේ ඉදිවූ ගඩලාදෙනිය විහාරයෙහි හින්දු වාස්තු විද්‍යා ලක්ෂණ බෞද්ධාගමික මුහුණුවරකින් යොදාගෙන ඇති ආකාරය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

3. යුරෝපයේ නූතනවාදී කලා ප්‍රවණතා ගුරුකොට ගනිමින්, විසිවැනි සියවස මැද භාගයේ බිහි වූ ශ්‍රී ලාංකීය චිත්‍ර හා මූර්ති ශිල්පීන් විසින් යුග මෙහෙවරක් ඉටු කරනු ලැබ ඇත.

   (i) නූතනවාදී මූර්ති කලාවේ ශිල්ප ක්‍රම භාවිත කරමින් තිස්ස රණසිංහ විසින් නිම කරන ලද මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2 යි.)

   (ii) ස්ටැන්ලි අබේසිංහ චිත්‍ර ශිල්පියාගේ සිතුවම් ශෛලිය පිළිබඳව ඔහුගේ කෘති ඇසුරු කරගනිමින් කෙටි ඇගයීමක් කරන්න. (ලකුණු 5 යි.)

   (iii) 43 කණ්ඩායමේ ප්‍රමුඛතම චිත්‍ර ශිල්පියෙකු වූ අයිවන් පීරිස්ගේ 'ආපසු ඒම' සහ 'ගල්කිස්ස' යන සිතුවම් ඇසුරින් ඔහුගේ කෘතීන්හි දිස්වන බටහිර නූතන චිත්‍ර කලා ප්‍රවණතා පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 8 යි.)

[දෙවැනි පිටුව බලන්න.

## 'ආ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව)

4. මෞර්ය වංශික ධර්මාශෝක රජුගේ පාලන සමයේදී ආරම්භ වූ බෞද්ධ කලා සම්ප්‍රදාය ගුප්ත යුගය අවසානය දක්වා පැවතියේ ය.

(i) අශෝක ස්ථම්භ **දෙකක්** නම් කරන්න. (ලකුණු 2යි.)

(ii) සාංචි ස්තූපයේ වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳව කෙටි පැහැදිලි කිරීමක් කරන්න. (ලකුණු 5යි.)

(iii) "අජන්තා බිතු සිතුවම් අතර ථෙරවාදී සහ මහායාන සම්ප්‍රදායන් දෙකටම අයත් සිතුවම් දක්නට ලැබේ." සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 8යි.)

5. ඉන්දීය බෞද්ධ කලා සම්ප්‍රදායන් අතර ප්‍රතිමා නිර්මාණකරණයේ වෙනස්කම් රැසක් දක්නට ලැබේ.

(i) ගාන්ධාර කලා සම්ප්‍රදායට අනුව නිම කළ පිළිම **දෙකක්** නම් කරන්න. (ලකුණු 2යි.)

(ii) මථුරා සම්ප්‍රදායට අයත් කත්‍රා බුදු පිළිමය ගැන කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 5යි.)

(iii) ගුප්ත යුගයට අයත් මථුරා බුදු පිළිමයේත් සාරනාත් බුදු පිළිමයේත් දක්නට ලැබෙන කලා ලක්ෂණ සංසන්දනාත්මකව විග්‍රහ කරන්න. (ලකුණු 8යි.)

## 'ඉ' කොටස

## (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - යුරෝපය)

6. 'අධියථාර්ථවාදය' (surrealism) යනු විසිවැනි සියවසේ චිත්‍ර කලාව නව මගකට යොමු කළ ප්‍රවණතාවකි.

(i) අධියථාර්ථවාදී චිත්‍ර ශිල්පීන් **දෙදෙනකු** නම් කරන්න. (ලකුණු 2යි.)

(ii) අධියථාර්ථවාදී කලාවේ මූලික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

(iii) අධියථාර්ථවාදය, යථාර්ථවාදී කලාවෙන් මෙන්ම වියුක්ත කලාවෙන් ද වෙනස් වන ආකාරය 'නොමියෙන මතකය' චිත්‍රය ඇසුරින් විමසන්න. (ලකුණු 8යි.)

7. පුරාතන සමයේ බලවත් රාජධානියක් වූ ඊජිප්තුවේ කලා කෘතිවල ඔවුනටම අනන්‍ය වූ සාම්ප්‍රදායික ලක්ෂණ බහුලව දක්නට ලැබිණි.

(i) සාම්ප්‍රදායික ලක්ෂණවලින් සමන්විත ඊජිප්තු මූර්ති **දෙකක්** නම් කරන්න. (ලකුණු 2යි.)

(ii) ඊජිප්තුවේ මූර්ති තුළ දක්නට ලැබෙන සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි.)

(iii) සාම්ප්‍රදායික ඊජිප්තු චිත්‍ර කලා ලක්ෂණවලට අනුව 'නාටිකාංගනාවෝ සහ සංගීතඥයෝ' නමැති සිතුවම සුවිශේෂී නිර්මාණයකි. ඒ බව 'කුරුලු දඩයම' සිතුවම සමග සංසන්දනය කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 8යි.)

* * *